# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| නිකුත් කළේ | බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2024.04.03 |

**පවත්වා ගෙන යා හැකි ව්‍යාපාරවලට ශක්තියක් වීම සඳහා බලපත්‍රලාභී බැංකු තුළ ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීමට මහ බැංකුව මාර්ගෝපදේශ නිකුත් කරයි**

දැනටමත් පිහිටුවා ඇති පශ්චාත් කොවිඩ්-19 යළි පණගැන්වීමේ ඒකකවල ක්‍රියාකාරිත්වය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා සහ එම ඒකක, ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක ලෙස වැඩිදියුණු කරලීම උදෙසා, 2024 මාර්තු 28 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත පුළුල් මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. යෝජිත ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකකවල වැඩි දියුණු කළ විෂය පථය මගින්, බලාපොරොත්තු නොවූ සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ බලපෑමට ලක් වූ, එනමුත් පවත්වා ගෙන යෑමට හැකියාව ඇති ව්‍යාපාර තිරසර ලෙස යළි නඟා සිටුවීමට පහසුකම් සැලසෙන අතර බලපත්‍රලාභී බැංකුවල ඉහළ ගිය අක්‍රීය ණය නිසි ලෙස හැසිරවීම ට සහාය වෙයි. මෙම මාර්ගෝපදේශ සකස් කිරීමේ දී මහ බැංකුව විසින් බැංකු ක්ෂේත්‍රය, වාණිජ මණ්ඩලය ඇතුළු අදාළ පාර්ශ්වකරුවන්ගේ අදහස් සලකා බලන ලදී.

මෑත වසරවල පැවති අභියෝගාත්මක සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ, ව්‍යාපාරවල ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් අඩපණ වීම, ණය ගැණුම්කරුවන්ගේ ණය නිසි ලෙස ගෙවීමට ඇති හැකියාවට අහිතකර ලෙස බලපා ඇති අතර එමඟින් බලපත්‍රලාභී බැංකුවල ණය අයකරගැනීමේ ක්‍රියාවලියට බාධා ඇති වී තිබේ. එම නිසා, තවදුරටත් ව්‍යාපාර පවත්වා ගෙන යෑමට හැකියාව ඇති සක්‍රීය සහ අක්‍රීය ණය ගැණුම්කරුවන්ගේ ව්‍යාපාර නැවත නඟාසිටුවීම සඳහා "ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක" පිහිටුවීම පිටුවහලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකකයන්හි කැපී පෙනෙන ලක්ෂණ පහත පරිදි වේ:**

(අ) ව්‍යාපාර යළි පණගැන්වීමට සහාය වීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් ඵලදායී ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි පවත්වාගෙන යෑම අවශ්‍ය වේ.

(ආ) බලපෑමට ලක් වූ ණය ගැණුම්කරුවන්ගේ ව්‍යාපාර වඩාත් ඵලදායීව සහ කාර්යක්ෂමව යළි පණගැන්වීමට සහාය වීම සඳහා, ශාඛා 50කට වඩා ඇති බැංකුවලට සිය ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකකයන් විශාල ශාඛාවල/ බැංකු ප්‍රාදේශීය කාර්යාලවල පිහිටුවීම සලකා බැලිය හැක.

(ඇ) ව්‍යාපාර යළි පණගැන්වීම සඳහා ව්‍යාපාරයක මූලික හැකියාව ඇගයීම ප්‍රධාන සාධකයකි. මෙම ශක්‍යතා තක්සේරුවේ දී ව්‍යාපාරයන්හි මූල්‍ය සහ මූල්‍ය නොවන දර්ශක යන දෙකම සැලකිල්ලට ගනු ලබයි.

(ඇ) දුෂ්කරතාවයට පත්වූ/පත්විය හැකි ව්‍යාපාරයක් යළි පණගැන්වීමේ ක්‍රියාවලියේ දී ණය ගැණුම්කරුගේ අඛණ්ඩ සහයෝගය ඉතා වැදගත් වේ.

(ඉ) ව්‍යාපාර යළි පණගැන්වීමේ දී, මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිව්‍යුහගත කිරීමේ මෙවලම් සහ ක්‍රියාවලි යන ද්විත්වයම, යළි පණගැන්වීමේ ක්‍රියාවලියට සම්බන්ධ පාර්ශ්වයන්ගේ අන්‍යොන්‍ය එකඟතාවයට යටත්ව සුදුසු අයුරින් භාවිතා කළ හැක.

(ඊ) බැංකු කිහිපයකින් ණය පහසුකම් ලබාගෙන ඇති ආයතනික ණය ගැණුම්කරුවන් ඔවුන් මුහුණ දෙන මූල්‍ය සහ/හෝ මෙහෙයුම් දුෂ්කරතා විසඳීම සඳහා, අධිකරණ මැදිහත්වීමකින් තොරව ස්වේච්ඡා සහ අන්‍යොන්‍ය වශයෙන් එකඟ විය හැකි පදනමක් මත "ආයතනික යළි පණගැන්වීමේ ගිවිසුමක්" සඳහා එකඟ විය හැකි ය. මෙම අරමුණු සඳහා, "ආයතනික ණය ගැණුම්කරුවන්" යනු, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව වාර්ෂික පිරිවැටුම රු. බිලියන 1ට වඩා වැඩි හෝ බලපත්‍රලාභී බැංකු වෙතින් ලබා ගෙන ඇති නොපියවූ මුළු ණය පහසුකම් රු. මිලියන 250ක් හෝ ඊට වඩා වැඩි ව්‍යාපාරයන් වේ.

(උ) බලපත්‍රලාභී බැංකු විසින් 2024 මැයි මස මැද වන විට ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවිය යුතු අතර, 2024 ජූලි 01 වන විට චක්‍රලේඛයේ අවශ්‍යතාවලට සම්පූර්ණයෙන් ම අනුකූල විය යුතුය.

වැඩිදියුණු කළ ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස ණය ගැණුම්කරුවන්ට ප්‍රතිලාභ සැලසීමට සහ ජාතික ආර්ථිකයේ සංවර්ධනයට දායක වීමට තිරසාර ලෙස ව්‍යාපාර යළි පණගැන්වීම සහතික කිරීම සඳහා ඵලදායී ව සහයෝගය දක්වන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්‍රලාභී බැංකුවලින් සහ අදාළ ණය ගැණුම්කරුවන්ගෙන් ඉල්ලා සිටී.

ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිළිබඳ වැඩිදුර විස්තර 2024 අංක 2 දරන "බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම සඳහා වූ මාර්ගෝපදේශ" පිළිබඳ චක්‍රලේඛයෙන් ලබා ගත හැකි අතර, එම චක්‍රලේඛයට පහත සබැඳිය හරහා ප්‍රවේශ විය හැක:

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_circular_no_2_of_2024_e.pdf